සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2022 ජනවාරි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2022-03-19
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සංකල්පනාත්මක ආකෘතිරාමුව අනුව අදාළ සහ විශ්වසනීය නියෝජනයකින් යුතු තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කරනු ලබන ගුණාත්මක ලක්ෂණ තිබේ. තවද, මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම පිළිබඳව ද ආකෘතිරාමුවේ සඳහන් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කරනු ලබන ගුණාත්මක ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම සඳහා භාවිත කරනු ලබන විවිධ මැනීමේ (different measurement) පදනම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

සංකලිත (integrated) වාර්තාකරණය ක්‍රියාත්මක කිරීම මගින් සාංගමික වාර්තාකරණය නව දිශානතියකට යොමුකරවන අතර, මූල්‍ය සහ තිරසාර වාර්තාකරණයෙහි සාර්ථකත්වය ඉක්මවා යාමට සලස්වා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "තිරසාර වාර්තාකරණය" යන පදය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) සංකලිත වාර්තාවේ ඇති ව්‍යාපාර ආකෘතියේ ඇතුළත්වන ප්‍රධාන ක්ෂේත්‍ර (key areas) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

ව්‍යාපාරයක ලාභදායිත්වය සහ මූල්‍යමය ශක්‍යතාවය පිළිබඳව පුළුල් විග්‍රහයක් කළ හැකිවන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විශ්ලේෂණයක් සහ අර්ථකතනය කිරීමක් මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණයක ඇතුළත් වේ. මූල්‍ය අනුපාත විශ්ලේෂණය, ව්‍යාපාරයක මූල්‍ය කාර්යසාධනය හඳුනාගැනීම සඳහා යොදාගනු ලබන එක් ක්‍රමයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයකට මූල්‍ය අනුපාත (financial ratios) විශ්ලේෂණය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(3) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) අනුපාත විශ්ලේෂණයෙහි සීමා (limitations) දෙකක්(2) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගනේෂ් සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) සමාගම, 2021 මාර්තු මාසයේදී නව නිෂ්පාදිතයක් සංවර්ධනය කිරීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණයක් සිදුකරන ලදි. මෙම වෙළෙඳපොළ පර්යේෂණය සිදුකිරීම සඳහා පර්යේෂණ සමාගමට රු.1,500,000/- ක මුදලක් ගෙවන ලදි.

(2) සමාගම, නව නිෂ්පාදිතය සඳහා වන පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කරන ලද අතර, එම පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කිරීමේ පිරිවැය රු.200,000/- ක් විය.

(3) පසුගිය වර්ෂ කිහිපය පුරාම සමාගම එහි දැනට සිටින ප්‍රධාන ගනුදෙනුකරුවන් සමඟ යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගන්නා ලදි. වර්ෂය තුළදී, නව නිෂ්පාදිතයේ අලෙවිය වැඩිකිරීමේ අරමුණින් පාරිභෝගිකයන් සඳහා පැවැත්වූ විනෝදාස්වාද වැඩසටහන් වෙනුවෙන් සමාගම රු. මිලියන 2 ක් දරණ ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 (LKAS 38) - අස්පෘශ්‍ය වත්කම් (Intangible Assets) අනුව, ඉහත එක් එක් පිරිවැය, අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ආර්යා (පෞද්ගලික) සමාගමේ** 2021 මාර්තු 31 දිනට සහ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහතින් දී ඇත:

**සීමාසහිත ආර්යා (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2021 | 2020 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 10,500 | 8,200 |
| සමුච්චිත ක්ෂය | (5,600) | (4,800) |
| **ධාරණ අගය** | **4,900** | **3,400** |
| **ජංගම වත්කම්:** | | |
| තොගය | 6,080 | 5,580 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 1,920 | 2,330 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 1,200 | 990 |
| | **9,200** | **8,900** |
| **මුළු වත්කම්** | **14,100** | **12,300** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 5,000 | 5,000 |
| රඳවාගත් ඉපැයීම් | 3,050 | 2,187 |
| | **8,050** | **7,187** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 3,300 | 2,700 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 1,600 | 1,200 |
| | **4,900** | **3,900** |
| **ජංගම වගකීම්:** | | |
| කෙටිකාලීන ණය | 150 | 50 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 750 | 330 |
| ගෙවිය යුතු ණය පොලී | 100 | 70 |
| ගෙවිය යුතු ආදායම් බදු | 150 | 763 |
| | **1,150** | **1,213** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **14,100** | **12,300** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම රු.105,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(2) 2020 අප්‍රේල් 01 දින යන්ත්‍රයක් ඉවත්කරන ලදි. එම යන්ත්‍රයේ පිරිවැය සහ 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය පිළිවෙලින්, රු. මිලියන 5.1 ක් සහ රු. මිලියන 2.5 ක් විය. මෙම යන්ත්‍රය ඉවත් කිරීමෙන් රු.750,000/- ක අලාභයක් ඇරිමට සිදුවිය. ඉවත් කරන ලද යන්ත්‍රය වෙනුවට වර්ෂය තුළදී නව යන්ත්‍රයක් මිලට ගන්නා ලදි. මෙයට අමතරව දේපළ, පිරියත සහ උපකරණවල වෙනත් කිසිදු මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුව නැත.

(3) වර්ෂය තුළදී ගෙවන ලද පාරිතෝෂිකය රු.360,000/- කි.

(4) වර්ෂය සඳහා වූ ණය මුදල් මත පොලිය රු.450,000/- ක් වූ අතර, රු.2,000,000/- ක ණය මුදලක් වර්ෂය තුළදී ලබාගෙන ඇත.

(5) වර්ෂය තුළදී කිසිදු ලාභාංශයක් කොටස්හිමියන් ට ගෙවා නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ආර්යා (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත රවී සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු අයකළ හැකි ලාභය රු.600,000/- කි.

(2) 2020 අප්‍රේල් 01 දිනට විලම්භිත බදු වත්කම රු.125,000/- කි.

(3) ජංගම නොවන වත්කම්වල ධාරණ අගය සහ බදු පදනම පහත පරිදි වේ:

| **අයිතමය** | **2021 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියාහල අගය) (රු.)** | **බදු පදනම (රු.)** |
|---|---|---|
| ගොඩනැගිලි | 10,000,000 | 12,000,000 |
| යන්ත්‍ර | 6,000,000 | 5,000,000 |

(4) සමාගමේ ආදායම් බදු අනුපාතය 14% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනට විලම්බිත බදු වත්කම / වගකීම. (ලකුණු 03)

(b) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු වියදම. (ලකුණු 02)

(B) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත X සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) ආදායම් බදු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018/19 තක්සේරු වර්ෂය සඳහා තක්සේරු නිවේදනයක් එවා ඇති අතර, ආදායම් බදු නොගෙවීම මත දඩ මුදලක් ද පනවා ඇත. තක්සේරුවට අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 2.7 ක් අයකර ඇත. එහි ගෙවීම පැහැර හරින ලද ආදායම් බද්ද රු. මිලියන 1.3 ක් වන අතර, ඉතිරි වටිනාකම වූ දඩ මුදල කපාහැර ගැනීමට (waived off) හැකිවේ යැයි කළමණාකාරිත්වය තුළ විශ්වාසයක් පවතී.

(2) 2018 වර්ෂයේදී වංචාවකට සැකකරුවෙක් වීම හේතුවෙන් සේවයෙන් පහකරන ලද සමාගමේ හිටපු සේවකයෙකු විසින් ඔහුගේ ඉවත් කිරීමට අදාලව රු. මිලියන 2 ක වන්දියක් ඉල්ලා සමාගමට විරුද්ධව නඩුවක් පවරා ඇත. පවතින සාක්ෂිවල වලංගුභාවය අනුව, සමාගමට මෙම වන්දිය ගෙවීම සඳහා පවතිනුයේ අඩු සම්භාවිතාවයක් බව සමාගමේ නීතිඥයා විශ්වාස කරයි.

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන දිනය වන විට ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවසන් තීන්දු ලබාදී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 (LKAS 37) - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතය අනුව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත එක් එක් සිද්ධිය හඳුනාගත යුත්තේ කෙසේදැයි යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත සෝනි සමාගමේ** 2020 අප්‍රේල් 01 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එහි ගොඩනැගිල්ලට අදාල පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කෙරේ:

*(රු.)*

| වත්කම | පිරිවැය | 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | 2020 අප්‍රේල් 01 දිනට ධාරණ අගය |
|---|---|---|---|
| ගොඩනැගිල්ල | 24,000,000 | 7,200,000 | 16,800,000 |

ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 40 ක් වූ අතර, ගොඩනැගිලි ඒවායෙහි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට සමාගම ක්ෂය කරනු ලබයි.

2020 අප්‍රේල් 01 දින ගොඩනැගිල්ලේ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන ලද අතර, ගොඩනැගිල්ලේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය, 2020 අප්‍රේල් 01 දිනට තවත් වර්ෂ 32 කින් ඉහළ ගොස් ඇතැයි එහිදී අනාවරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනට ගොඩනැගිල්ලේ සමුච්චිත ක්ෂය සහ ධාරණ අගය **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) 2020 අප්‍රේල් 01 දින, **සීමාසහිත සිග්මා සමාගම** (කල්බදු ගැනුම්කරු), **ABC මූල්‍ය සමාගම** (කල්බදු විකුණුම්කරු) සමඟ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා වන කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. කල්බදු ගිවිසුමට අදාලව පහත සඳහන් තොරතුරු ලබා දී ඇත:

| | |
|---|---|
| යන්ත්‍රයෙහි සාධාරණ වටිනාකම | රු.3,000,000/- |
| කල්බදු ගිවිසුම ආරම්භයේදී ගෙවූ අත්තිකාරම් මුදල | රු.1,000,000/- |
| කල්බදු කාල සීමාව | වර්ෂ 3 |
| වාර්ෂික කල්බදු වාරිකය | රු.832,635/-<br>(සෑම වර්ෂයකම මාර්තු 31 දින ගෙවිය යුතුය) |
| ව්‍යංග පොලී අනුපාතය | වාර්ෂිකව 12% |

කල්බද්ද සඳහා වන පළමු වාරිකය 2021 මාර්තු 31 දින ගෙවන ලද අතර, කල්බදු ගිවිසුමට අනුව, කල්බදු කාලසීමාව අවසානයේදී යන්ත්‍රයේ හිමිකම **සීමාසහිත සිග්මා සමාගමට** මාරු වේ. වත්කම භාවිත කිරීමේ හිමිකම, වත්කමේ කල්බදු කාලසීමාව පුරා සරල මාර්ග ක්‍රමයට **සීමාසහිත සිග්මා සමාගම** විසින් ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කල්බදු ගනුදෙනුවට අදාලව, **සීමාසහිත සිග්මා සමාගමේ** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන් **පිළියෙල කරන්න**.

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත රිවී පොදු සමාගමේ** පොත්වලින් 2021 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත රිවී සමාගම**

**2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 10,000,000) | | 100,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 3,000 |
| 2020 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 22,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට / ප්‍රත්‍යාගණිත අගයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ ප්‍රත්‍යාගණිත අගය - රු. මිලියන 44) | 62,000 | |
| යන්ත්‍ර | 14,000 | |
| පරිගණක මෘදුකාංගය | 3,000 | |
| **2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 12,000 |
| යන්ත්‍ර | | 6,000 |
| පරිගණක මෘදුකාංගය | | 1,200 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 18,000 | |
| 2021 මාර්තු 31 දිනට තොගය | 28,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 21,700 | 15,600 |
| 2020 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වූ ප්‍රතිපාදනය | | 3,000 |
| ඉදිරියට කළ ගෙවීම් | 12,000 | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 25,100 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 81,000 | 150,000 |
| වෙනත් ආදායම් | | 2,100 |
| 2020 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 3,500 |
| ගෙවූ ආදායම් බදු | 7,200 | |
| පරිපාලන වියදම් | 34,200 | |
| බෙදාහැරීමේ වියදම් | 21,000 | |
| මූල්‍ය වියදම් | 6,200 | |
| බැංකු ණය | | 15,000 |
| | **333,400** | **333,400** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී, නරක ගුණාත්මයෙන් යුතු භාණ්ඩ විකුණන ලදැයි සඳහන් කරමින් රු. මිලියන 1 ක වන්දියක් ඉල්ලා ගනුදෙනුකරුවෙකු විසින් සමාගමට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනුකර ඇත. අදාල ගනුදෙනුකරුට රු.750,000/- ක් වන්දි වශයෙන් ගෙවන ලෙසට 2021 මැයි 20 දින අධිකරණය විසින් සමාගමට නියෝගකර ඇත. මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු ගැලපීමක් සිදුකර නොමැත.

(2) 2020/21 මූල්‍ය වර්ෂය සඳහා වූ රු.600,000/- ක විගණන ගාස්තුව ගිණුම්ගත කර නොතිබුණි. ඉදිරියට කළ ගෙවීම් ගිණුමෙහි නිරූපණය වනුයේ 2021 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා ගෙවන ලද කුලී ගෙවීමයි.

(3) 2020 අප්‍රේල් 30 දින, කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා, සමාගම විසින් 10% වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 15 ක ණය මුදලක් ලබාගෙන ඇත. ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් 2020 මැයි 01 දින ආරම්භ කරන ලද අතර, 2021 මාර්තු 31 දින වන විට එය ඉදිකෙරෙමින් පැවතුණි. වර්ෂය තුළදී ඉදිකිරීම සඳහා දරණ ලද පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමෙහි වාර්තාකර ඇති අතර, වර්ෂය සඳහා වන ණය සඳහා වූ පොලිය, මූල්‍ය වියදම් ගිණුමෙහි වාර්තාකර ඇත. ප්‍රාග්ධන ආපසු ගෙවීම් සඳහා වර්ෂයක සහන කාලයක් බැංකුව විසින් ලබාදී ඇති අතර, ණය මුදලින් ¼ ක් ඊළඟ වර්ෂයේදී ගෙවිය යුතුය.

(4) සමාගමට, රු.500,000/- ක මුදලක් ලැබිය යුතුව තිබූ ණයගැතියෙකු 2021 මාර්තු 31 දින බුන්වත්භාවයට පත්වූ බව සමාගම වෙත දැනගැනීමට ලැබී ඇත. ඔහුගෙන් අයවිය යුතු මුදල සඳහා පසුගිය වර්ෂයේදී සම්පූර්ණයෙන් ප්‍රතිපාදනයක් සිදුකර තිබේ. තවද, 2021 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක ප්‍රතිපාදනයක් සිදුකිරීමට ද තීරණය කර ඇත.

(5) 2019/20 තක්සේරු වර්ෂය සඳහා වන සම්පූර්ණ ආදායම් බදු වගකීම රු.3,500,000/- ක් වූ අතර, එය 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගෙවන ලද අතර එය ගෙවූ ආදායම් බදු ගිණුමට අයකර ඇත. 2020/21 තක්සේරු වර්ෂය සඳහා වන සම්පූර්ණ ආදායම් බදු වගකීම රු.5,300,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(6) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂ 20 |
| යන්ත්‍ර | : | වර්ෂ 04 |
| පරිගණක මෘදුකාංගය | : | වර්ෂ 04 |

(7) සමාගම, 2021 මාර්තු 31 දින යන්ත්‍ර සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදුකරන ලද අතර, යන්ත්‍රයේ ඉවත්කිරීමේ පිරිවැය අඩුකළ පසු සාධාරණ වටිනාකම රු.3,000,000/- ක් වන බවත් යන්ත්‍රයේ භාවිතයට ගැනීමේ අගය (value in use) රු.3,400,000/- ක් වන බවත් එහිදී අනාවරණය විය. හානිකරණය සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු ගැලපීමක් සිදුකර නොතිබුණි.

(8) මීට වර්ෂ 2 කට පෙරාතුව ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවූ අතිරික්තය, ප්‍රත්‍යාගණන සංචිතයෙහි නිරූපණය වේ.

(9) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2021 ජූනි 30 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත රිවී පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(c) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 02)

(d) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

2021 මාර්තු 31 සහ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / දිනට පහත සඳහන් තොරතුරු **සීමාසහිත බීෂ්මා පොදු සමාගමේ** පොත්වලින් උපුටාගෙන ඇත:

*(රු.'000)*

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2021** | **2020** |
|---|---|---|
| විකුණුම් | 372,400 | 320,300 |
| විකුණුම් පිරිවැය | 203,500 | 178,500 |
| පොලී වියදම | 7,220 | 5,950 |
| ආදායම් බදු | 4,000 | 3,800 |
| වර්ෂය සඳහා වූ ලාභය | 22,700 | 17,800 |
| **මාර්තු 31 දිනට** | **2021** | **2020** |
| රඳවාගත් ඉපැයීම් | 41,600 | 18,900 |
| ජංගම වත්කම් | 151,400 | 140,200 |
| ජංගම වගකීම් | 47,400 | 33,100 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 38,300 | 25,900 |
| තොගය | 95,400 | 88,400 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 5,500,000) | 55,000 | 55,000 |

සියලුම මිලදී ගැනීම් ණය පදනම මත සිදුකර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා / දිනට පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ක්ෂණික වත්කම් අනුපාතය.

(iii) තොග නේවාසික කාලය.

(iv) ණයහිමියන් පියවීමේ කාලය.

(v) කොටසක ඉපැයුම. (ලකුණු 05)

(b) 2020/21 වර්ෂය සඳහා පහත සඳහන් කර්මාන්ත සාමාන්‍යයන් ද ගණනය කර තිබුණි:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 52% |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.25 : 1 |
| තොග නේවාසික කාලය | දින 35 |
| ණයහිමියන් පියවීමේ කාලය | දින 42 |
| කොටසක ඉපැයුම | රු.7.50 |

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / දිනට **සීමාසහිත බීෂ්මා පොදු සමාගමේ** කාර්යසාධනය, කර්මාන්ත සමාන්‍යයන් සමඟ **විශ්ලේෂණය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 10 වන ප්‍රශ්නය

පහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, 2021 මාර්තු 31 දිනට, **සීමාසහිත හිරු සමාගමෙන්** සහ **සීමාසහිත තරු සමාගමෙන්** උපුටා ගන්නා ලදි:

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | සීමාසහිත හිරු සමාගම | සීමාසහිත තරු සමාගම |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ ධාරණ අගයට | 60,000 | 55,000 |
| **සීමාසහිත තරු සමාගමේ** ආයෝජනය | 40,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොගය | 13,000 | 18,000 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 20,000 | 15,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 12,000 | 15,000 |
| | **45,000** | **48,000** |
| **මුළු වත්කම්** | **145,000** | **103,000** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 60,000 | 40,000 |
| රඳවාගත් ඉපැයීම් | 14,500 | 17,200 |
| | **74,500** | **57,200** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 16,000 | 32,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 54,500 | 13,800 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **145,000** | **103,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) **සීමාසහිත හිරු සමාගම,** 2020 අප්‍රේල් 01 දින **සීමාසහිත තරු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් අත්පත් කරගෙන ඇත. අත්පත් කරගත් දිනට පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය රු. මිලියන 20 කි. අත්පත් කරගත් දිනට **සීමාසහිත තරු සමාගමේ** රඳවාගත් ඉපැයීම් රු. මිලියන 13 ක් වූ අතර, **සීමාසහිත තරු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය, ඒවායෙහි පොත් අගයට සමාන විය.

(2) 2018 අප්‍රේල් 01 දින, **සීමාසහිත හිරු සමාගම** රු. මිලියන 5 ක පිරිවැයකට මිලට ගත් මෝටර් රථයක් 2020 අප්‍රේල් 01 දින, **සීමාසහිත තරු සමාගම** වෙත රු. මිලියන 6 කට විකුණන ලදී. සමාගම් දෙකම ඔවුන්ගේ මෝටර් රථ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වර්ෂ 5 ක කාලයක් පුරා ක්ෂය කරනු ලබයි.

(3) 2021 මාර්තු මාසය තුළදී, **සීමාසහිත තරු සමාගම** විසින් රු. මිලියන 10 ක පිරිවැය වූ තොගයක්, පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව **සීමාසහිත හිරු සමාගම** වෙත විකුණන ලදී. මෙයින් 50% ක තොග, 2021 මාර්තු 31 දිනට **සීමාසහිත හිරු සමාගමේ** ගබඩාව තුළ නොවිකිණී තිබුණි. තවද, මෙම ගනුදෙනුවට අදාළ සම්පූර්ණ වටිනාකම **සීමාසහිත හිරු සමාගමේ** වෙළෙඳ ගෙවිය යුතු මුදල් තුළත්, **සීමාසහිත තරු සමාගමේ** වෙළෙඳ ලැබිය යුතු මුදල් තුළත් සටහන් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) 2021 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 11)

(මුළු ලකුණු 15)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |